# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1925/43 – 2015 ජූලි 29 වැනි බදාදා – 2015.07.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පහසිය පත්තුව සුළු කොට්ඨාසයේ, රජ්ජම්මන (අ.ග.පි. 25) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක: එම්ජ්/එම්ටීඑල්/2014/03 හා 2014.06.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන්, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1700 ක් පමණ වන "රජ්ජම්මන වත්ත" නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර "ඒ" – රජ්ජම්මන වත්ත – ප්‍රමාණය: හෙක්. 0.1700 ක් පමණ**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස, මාර්ගය සහ අඩිපාර; නැගෙනහිරට: අඩිපාර සහ අඹන්ගඟ රක්ෂිතය; දකුණට: අඹන්ගඟ රක්ෂිතය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2013/ඩබ්ලිව්එස්/425.
2015 මැයි මස 13 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 385

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සාරසිය පත්තුව කෝරළේ සුළු කොට්ඨාසයේ, දුනුවිල, විහාරගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක: එම්ඒඑච්ඒ/ඒකේආර්/2014/560 හා 2014.10.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන්, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0624ක් පමණ වන "පිහිල්ලේ ඇලේ හේන" නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

**කැබලි අක්ෂර "ඒ" – පිහිල්ලේ ඇලේ හේන – ප්‍රමාණය: හෙක්. 0.0624 ක් පමණ**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස, මාර්ගය (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට:මාර්ගය (ප්‍රාදේශීය සභා); දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2014/ඩබ්ලිව්එස්/141.
2015 ජූනි මස 04 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 386